# ශ්‍රී ලංකාවේ පුරාවස්තු ආරක්ෂණය සම්බන්ධයෙන් නෛතික රාමුවෙහි ක්‍රියාකාරීත්වය : තෝරාගත් පනත් ත්‍රිත්වයක් ඇසුරෙනි

**කේ. ජී. මහේෂි සමරවික්‍රම**

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
maheshisamarawickrama193@gmail.com

---

අතීතයේ සිට ම රජ දරුවන් සංස්කෘතික උරුමයන් ආරක්ෂණය සඳහා නොයෙකුත් ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කළ අතර ඒ බව අභිලේඛන සහ ලිඛිත මූලාශ්‍රය හරහා අනාවරණය වේ. මුල්කාලීනව දැඩි නෛතික බැඳීමකින් තොරව බලගැන්වුණු ආරක්ෂණ වැඩපිළිවෙල 19 වන සියවස පමණ වන විට සංකල්පමය වශයෙන් නෛතික සහ විධිමත් ස්වභාවයෙන් ක්‍රියාවට නංවා තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙසින් පුරාවස්තූන් ආරක්ෂාව හා අනාගතය සඳහා සුරක්ෂිත කරනු වස් ප්‍රධාන අණ පනත් කිහිපයක් හඳුන්වාදී තිබේ. මෙහිදී එම අණ පනත් අතරින් සංස්කෘතික දේපළ ආරක්ෂණය සඳහා බලපෑම් කරන්නා වූ සංස්කෘතික දේපළ පනත, පුරාවස්තු ආඥා පනත සහ මධ්‍යම සංස්කෘතික අරමුදල් පනත යන පනත් ත්‍රිත්වය කේන්ද්‍ර කරගනිමින් නෛතිකව පුරාවස්තූන් විධිමත් අයුරින් ආරක්ෂණය නොවීම සඳහා පවතින්නා වූ නෛතික දුර්වලතා විමර්ශනය කිරීමට බලාපොරොත්තු වේ. මෙම පර්යේෂණයේදී සමකාලීන දත්ත ලබාගැනීම සඳහා මාධ්‍ය වාර්තා භාවිතයට ගනු ලැබිණි. මෙහිදී ඉහත පනත් අභියෝගයට ලක්වීම කෙරෙහි දේශපාලන බලපෑම් සහ පන්තික බලපෑම් ප්‍රබලව බල පවත්වන බවද සංස්කෘතික වස්තූන් විශාල ප්‍රමාණයක් ඒකරාශි වී පවතින ශ්‍රී ලංකාවේ යම් යම් නෛතික හිඩැස් හේතුවෙන් උරුමයන් අවධානයට ලක් වීමේ ප්‍රවණතාවය තවදුරටත් වර්ධනය වී ඇති බව ද හඳුනාගනු ලැබිණි. මෙම තත්ත්වය සඳහා යෝජනා අතර අවධානයට සහ අවධානමට භාජනය වන උරුමයන් සඳහා වෙනම ම නෛතික ආවරණයක් පැවතීමේ වැදගත්කම, ක්ෂේත්‍රය පිළිබඳව දැනුම ඇති පුද්ගලයන් ආශ්‍රිතව නෛතික බලය පැවරීමේ උචිත බව සහ පුරාවස්තූන් කෙරෙහි වෙළෙඳ අගයන් නියම නොකිරීමට අදාළ පාර්ශවයන් උනන්දු කරවීම ආදිය ප්‍රධාන වේ. නෛතික රාමුව විධිමත් අයුරින් ක්‍රියාත්මක කිරීමට නම් පැරණි නීති සංශෝධනය විය යුතු බව හා බොහෝ දූෂිත ක්‍රියාවන් පසුපස සිටින දේශපාලන හස්තය ඉවත් කළ යුතු බව ද මෙහි දී නිගමනය කරනු ලැබිණි.

ප්‍රමුඛ පදඃ නෛතික රාමුව, පුරාවස්තු, අණ පනත්